සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
Sabaragamuwa Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය 2018
இரண்டாம் தவணைப் பரீட்சை 2018
Second Term Test 2018

6 ශ්‍රේණිය
தரமடு 6
Grade 6

සිංහල භාෂාව හා සාහිත්‍යය 1-11
Sinhala Language And Literature 1-11

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two Hour

## I කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්නත

1 සිංහල අක්ෂර මාලාව ප්‍රධාන කොටස් දෙකකින් සමන්විතය එය නිවැරදිව දැක්වෙන වරණය වන්නේ.

i මහප්‍රාණ අක්ෂර - ස්වරාක්ෂර
ii ව්‍යඤ්ජනාක්ෂර - සඤ්ඤකාක්ෂර
iii ස්වරාක්ෂර - ව්‍යඤ්ජනාක්ෂර
iv අල්පප්‍රාණාක්ෂර - මහප්‍රාණ අක්ෂර

2 " ශාස්ත්‍රෘන් " යන පදයෙහි ඇතුළත් පිල්ලම් නිවැරදිව නම් කර ඇති වරණය වන්නේ

i ඇලපිල්ල, හල් කිරීම, ගැටපිල්ල, හල්කිරීම
ii ඇදය, හල් කිරීම, ගැටපිලි දෙක, හල්කිරීම
iii ඇදය, ඉස්පිල්ල, ගැටපිලි දෙක, හල්කිරීම
iv ඇලපිල්ල, හල් කිරීම, ගැටපිලි දෙක, හල්කිරීම

3 සඤ්ඤක අක්ෂර පමණක් යෙදුණු වචන ඇතුළත් වරණය තෝරන්න.

i කඳු, හඬ, අඹ, රඟ
ii කඹ, කඳ, අබ, ලඳ
iii බැද, ඇද, රඹ, තඹ
iv පුද, වද, ළඟ, හඳ

4 ඔවුහු නිතර සතුන් ආරක්ෂා කරති යන වාක්‍යයෙහි උක්ත නාම පදය තෝරා ලියන්න
....................................

5 පහත වාක්‍යයෙහි තද කළු අකුරින් මුද්‍රිත පදයේ තේරුම අයත් වරණය තෝරන්න.

අම්මා **කුකුළා අතින් ගෙන** ගොවිපල වෙත ගියාය.

i උදෑසනින් ii සවස් කාලයේ iii දවල් කාලයේ iv රාත්‍රි කාලයේ

6 පහත සඳහන් වාක්‍යයන්හි නාම විශේෂණ පද තෝරා ලියන්න

i. ඒ පොකුණෙහි එක් දිය රකුසෙක් පොකුණට බට මිනිසුන් කන්නේ ය.

ii ඇගේ දිගු වරලස හරිම ලස්සනයි.

7 " මම පොත කියවමි." යන වාක්‍යය

i ප්‍රථම පුරුෂ ඒක වචන වාක්‍යයකි
ii මධ්‍යම පුරුෂ ඒක වචන වාක්‍යයකි
iii උත්තම පුරුෂ ඒක වචන වාක්‍යයකි
iv උත්තම පුරුෂ බහු වචන වාක්‍යයකි

8 "තමා පිළිබඳ පමණක් සිතා කටයුතු කරන" යන්නට තනි පදයක් වන්නේ

i බහුශ්‍රැත ii පරාර්ථකාමී iii ආත්මාර්ථකාමී iv සර්වඥ

9 දී ඇති ඒක වචන පදවලට බහුවචන පද ලියන්න.

i මම........................ ii පුටුව..........................
iii කුරුල්ලා.............................. iv ගැමියා..........................

10 දී ඇති පදයට සමාන පදය බැගින් ලියන්න

i අනතුර .......................... ii යහළුවා ............................

11 මුලින් දී ඇති පදයට විරුද්ධ පදය බැගින් ලියන්න

i ආගන්තුක .................... ii විදේශික ........................
iii පිරිසිදු ............................. iv දොම්නස .....................

12 පහත සඳහන් වාක්‍ය අතීත කාලයට හරවා නැවත ලියන්න

i ශිෂ්‍යයෝ පුස්තකාලයට යති .........................................................
ii මම පොත කියවමි .........................................................

13 සුදුසු ආඛ්‍යාත පද යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න

i ඔවුහු වනයට....................................(පිවිසියහ/පිවිසියේ ය)
iii ගුවන් යානාවෝ අහසේ පියාසර .............................(කරති/කරයි)

14 ............................තුනුරුවන් නමදිමු.

i අපි ii මම iii ඔහු iv ඇය

15 කුරුල්ලෝ අහසේ පියාසර..............................

i කළේ ය ii කරන්නේ ය iii කරති iv කරයි

16 .............................. රෝගීන් රැක බලා ගනිති.
i හෙදියෝ ii හෙදියන් iii හෙදියක iv හෙදීන්

- අංක 17 සිට 19 තෙක් දීඇති වාක්‍යවල නිවැරදි ආඛ්‍යාතය යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

17 මිනිස්සු ශ්‍රමදානයට සහභාගි ............................

18 ඔබ ගමට............................

19 තොපි නැටුම් බලන්නට................................

20 පහත සඳහන් පිරුළු සම්පූර්ණ කරන්න.

i වඩින්න ගිය දේවාලේ...................................
ii කොහොඹ ගහට...........................ගියා වගේ.

## II කොටස

- මෙම ප්‍රශ්න පත්‍රයට ලකුණු 60 ක් හිමි වේ.

1 පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 150 කට නොඅඩු රචනාවක් ලියන්න.

1 වචන්නෝ දිනන්නෝ
2 මිහිකත සුරකින තුරුලිය
3 ජල සම්පත සුරකිමු
4 මා කැමතිම ලේඛකයා
5 මගේ හොඳම මිතුරා (ලකුණු 20 යි)

2 ඔබ විසින් පන්ති කාමරයේ දී කරන ලද කණ්ඩායම් ක්‍රියාකාරකමක් සම්බන්ධ කර ගනිමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

i පන්ති කාමරයේ දී ඔබ කණ්ඩායම් ක්‍රියාකාරකම කළේ කුමක් සම්බන්ධයෙන් ද?

ii ක්‍රියාකාරකම කිරීම සඳහා ඔබට ලැබුණු උපදෙස් දෙකක් ලියන්න

iii ක්‍රියාකාරකම සඳහා යොදාගත් සම්පත් දෙකක් නම් කරන්න.

iv ක්‍රියාකාරකම සඳහා උපදෙස් ලබා දුන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

v ක්‍රියාකාරකම ඇසුරින් ඔබ ලබාගත් අත්දැකීමක් ලියන්න

(ලකුණු 10 යි)

3 පහත දැක්වෙන උද්ධෘතවලට අදාළ ව වගුවේ දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

| උද්ධෘතය | පාඩම | කීවේ කවුද? | කීවේ කාටද? |
|---|---|---|---|
| 1 | හා හා මම එහෙමත් කරනවද ? | | |
| 2 | මේක එක කටකටත් මදිනෙ | | |
| 3 | ස්වාමීනි අපි ඉඳිකටු කුළා නිසා බට දඬු ගෙනවුම්හ | | |
| 4 | මෙච්චර හොඳ වතුර මම කවදාවත් දැකලා නැහැ | | |
| 5 | අම්මේ අනික් පාර මමත් බෝට්ටුවෙන් යනවා | | |

(ලකුණු 15 යි)

4 පහත දැක්වෙන අවස්ථා අතුරින් එක් අවස්ථාවක් තෝරා ගෙන සුබ පැතුම්පතක් නිර්මාණය කරන්න.

i ලෝක ගුරු දිනය වෙනුවෙන් පන්ති භාර ගුරුතුමාට

ii උසස් අධ්‍යාපනය වෙනුවෙන් විදේශගත වන අයියාට

නැතහොත්

ඔබ පාසලේ පැවැත්වෙන විවිධ ප්‍රසංගය නැරඹීමට පැමිණෙන ලෙස දන්වා ඔබේ හොඳම මිතුරාට ලියන ලිපිය ලියන්න.

(ලකුණු 15 යි)

දෙවන වාර පරීක්ෂණය 2018

**සිංහල භාෂාව හා සාහිත්‍යය I    පිළිතුරු    6 ශ්‍රේණිය**

1 iii
2 iv
3 i
4 ඔවුහු
5 i
6 දිය, දිගු
7 iii
8 iii
9 i. අපි  ii. පුටු  iii කුරුල්ලෝ  iv ගැමියෝ
10 i කරදරය, විපත  ii මිතුරා, සකි
11 i. නේවාසික  ii. ස්වදේශික  iii අපිරිසිදු  iv සොම්නස
12 i ශිෂ්‍යයෝ පුස්තකාලයට ගියෝ ය/ගියහ
ii මම පොත කියෙව්වෙමි
13 i පිවිසියහ  ii කරති
14 අපි
15 කරති
16 හෙදියෝ
17 වෙති/වූහ
18 ගියෙහි/ගියෙහු/යති/යහු
19 ගියෙහු/යහු/යන්නෙහු
20 i ඉහේ කඩා වැටුණා වගේ
ii කරවිල වැල